# කෘෂි තාක්ෂණ තොරතුරු

කෘෂි තාක්ෂණ තොරතුරු කඩිනමින් ගොවි ජනතාව අතරට ලබාදීමේ අත්වැලකි

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයේ ප්‍රකාශනයකි

තාක්ෂණික පත්‍රිකා අංක 03 - 2021 ජනවාරි




## "කහ පුරුක් පණුවා" බිහි කරන සලබයින් කුඹුරේ ඉන්නවාද ?

පළිබෝධකයින් මගින් සිදුකෙරෙන වගා ආක්‍රමණයන් පාලනය කිරීම සඳහා ඔවුන්ගේ පැමිණීම කල්තබා හඳුනාගෙන සුදුසු පිළියම් යෙදීමේ වැදගත්කම දිගින් දිගටම අප පෙන්වා දී තිබේ. එහෙත් ගොවි ජනතාව විසින් මෙම උපදෙස් සැළකිල්ලෙන් ග්‍රහණය කරන බවක් පෙනෙන්නට නැත. ඔවුන් නිතරම අවදිවන්නේ පළිබෝධකයා විසින් හානිකල බෝගය දකිනවිටය. එහෙත් බොහෝ අවස්ථාවලදී එවිට කරන්නට කිසිවක් ඉතුරුව නැත. තිබෙනවානම් ඇත්තේ ජයග්‍රහණය පළිබෝධකයාට භාරදී ඉතිරිව ඇති දෙයක් එකතුකර ගැනීම පමණි. පසුගියදා මහත් ආන්දෝලනයක් ඇතිකළ "සේනා" දළඹු වසංගතයේ තත්වයද මීට වෙනස්වූයේ නැත. "සේනා" මෙරට ආක්‍රමණය කල 2018 මාස් කන්නය තුළ මෙම ආගන්තුක සත්වයාව කෘෂි විද්වතුන්ගේ උපදෙස් අනුගමනය කරමින් ඉතා සාර්ථකව පාලනය කරගන්නා ලදි. එදා මුළු රටටම "සේනා" ආගන්තුකයෙක් වූවා පමණක් නොව සත්වයාගේ හැසිරීම, ජීවන ප්‍රවෘත්තිය වැනි සෑම දෙයක්ම අපට අලුත් විය. එහෙත් ජයග්‍රහනයද අප සතුවූයේ විද්‍යානුකූලව, ඉවසීමෙන් හා සැළකිල්ලෙන් ප්‍රශ්නය වෙත යොමුවූ බැවිනි. නමුත් මෙවර මහ කන්නයේදී සිරිතට අනුව බඩඉරිඟු සිටවූවාට සමාජ අවධානය වැඩිපුර යොමුව තිබුනේ වසංගත වටපිටාව වෙතටයි. "සේනා" බඩඉරිඟු ගොබය සොයා එනතෙක් ගමන අවහිර කරන උපායමාර්ග අනුගමනය කර තිබුනේ ඉතා අල්ප වශයෙනි.



ගොයමට හානිකරන කහ පුරුක් පණුවා ගේ තත්වයද මීට දෙවැනි නැත. මෙරට බොහෝ පළාත්වලින් කලක සිට වාර්තාවෙන මෙම පළිබෝධකයා ද, "සේනා" දළඹුවා මෙන්ම සලබයෙකුගේ කීට අවස්ථාවකි. සලබයාගේ නම *Scirpophaga incertulas* ය. හෙතෙම ගොයමේ වර්ධක අවධියටත්, මල් පිපෙන ප්‍රජනක අවධියටත් යන දෙකටම හානිකිරීමේ හැකියාව දරයි. මහ කන්නයට වගාකළ බොහොමයක් කුඹුරු දැන් තිබෙන්නේ ඉහත දැක්වූ දෙවැනි අවස්ථාවේදීය.



වර්ධක අවධිය පසුවූවා යයි සිතමින් දැන් වුවත් සැනසිල්ලේ වගාකරු ගිමන්හැරිය යුතු නොවේ. සලබ ආක්‍රමණයට තවමත් ඉඩ ඇත. සලබයා පැමිණ බිත්තර දැම්මානම් උපදින පැටවුන් නොහොත් කහ පුරුක් පණුවන්, ගොයමේ පටක තුළට ඇතුළුව පරිවහන පද්ධතිය ඇතුළු පටක වලට හානි කිරීම නිසා වැඩෙන කරලට ආහාර නොලැබී එහි ඇට සියල්ලම බොල්වේ. දැන් උපදින්නේ සුදු පැහැති බොල් කරලකි. ගොවීන් අතර මෙය ව්‍යවහාර වන්නේ සුදු කරල් පීදීම කියාය. අවදානම කලින්ම හඳුනාගත යුත්තේ සුදුකරල් පීදෙනවිට පළිබෝධනාශක ටැංකිය කරට ගැනීම නිෂ්පල ව්‍යායාමයක් බැවිනි. නමුත් බොහෝ තැන්වලදී රෝගය මර්දනය කිරීමේ පිළිවෙත් ගැන ගොවියා විමසන්නේ සුදුකරල් පීදෙන රෝග ලක්ෂණ කුඹුරෙන් දකිනවාත් සමගය. බොහෝ දුරට ඒ වනවිට පළිබෝධකයා තම ජීවන චක්‍රයත් සම්පූර්ණ කරගෙන, වැනසූ ගොයමත් ගොවියාටම ඉතිරිකර වෙනත් ඉසව්වක් කරා පියඹා ගොස්ද අවසන්ය.

**"මදුරු දැල් කෑල්ලක් කම්බි රවුමක සවිකරලා, ඒකට මිටකුත් ගසාගෙන පුංචි අතංගුවක් හදාගන්න ඕනෑ. දැන් මේක අරන් කුඹුරට ගිහින්, වාර දහයක් විතර අතංගුව ඒ මේ අත වනමින් යම් නිශ්චිත දුරක් ගමන් කරලා සලබයෝ අල්ලන්න පුළුවන්. හිමිදිරි වෙලාව තමයි හොඳ. දැන් අපි දන්නවනේ ගමන්කළ ක්ෂේත්‍රඵලය. අහුවුන සලබයෝ ගානත් ගණන් කරගන්න පුළුවන්නේ. එහෙනම් හදාගන්න අක්කරයට සිටින සලබ ගහනය කීයද කියලා. එක සලබයෙක් බිත්තර 300 ක් දානවනම්, විනාශ වී යන කීට ප්‍රමාණයකටත් ඉඩ දීලා පනුවන් 50-75 ක් විතර ඉතිරිවෙනවා කියලත් උපකල්පනය කෙරුවොත්, ඊළඟට බලන්න එක්කෙනාට එක ගන්නේ වී කරල් කීයක් මේ අය විනාශ කරයිද කියලා. වී කරලක තියෙන ඇට ගැන දන්නවනම්, එහි බර ඇසුරෙන් දැන් සොයාගන්න පුළුවන් මේ සලබ ගහනයට මෙහෙමම ඉන්න දුන්නොත් අනාගතයේදී අහිමිවෙන වී අස්වැන්නේ ප්‍රමාණය"**





ඉතාමත් ප්‍රායෝගික හා තර්කානුකූල විස්තරයක් මගින් පළිබෝධ හානියේ තරම පුරෝකථනය කළ හැකි ආකාරය විස්තර කරනු ලැබුවේ බතලගොඩ වී පර්යේෂණායතනයේ සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ (පර්යේෂණ ), කෘමි විද්‍යාඥ එස්.ආර්. සරත්චන්ද්‍ර මහතායි. අහිමිවන අස්වැනු සම්පත ගණනය කරගත්තායින් පසු ගොවියා කළයුත්තේ එය රුපියල් සත වලට හරවා හානියේ තරම පසුම්බියට දැනෙන්නේ කෙසේද යන්න අවබෝධ කරගැනීමයි. පළිබෝධනාශකයක් වෙනුවෙන් වියදම්කර හානිය වළක්වාගන්නවාද, සලබයාට ඉන්නටදී ඉතිරිවෙන අස්වැන්නක් භාරගන්නවාද යන දෙකෙන් වඩාත් ලාභදායී කුමක්දැයි තමාගෙන්ම විමසා බැලීම ගොවියාට භාරය. පැරණි ගොවියානම් මෙවන් විධිමත් ගණනය කිරීමක් කෙරුවේ නැත. එහෙත් හෙතෙම අදට වඩා සැළකිල්ලෙන් ගොයම බලාගත් බව අපට මතකය. රාත්‍රියට විදුලි පන්දමක් රැගෙන නියර දිගේ ඇවිදින ඔහු, විදුලි පහනේ ගැටෙන සලබයින් සංඛ්‍යාව මත අනාගත හානියක පෙරනිමිති දුටුවේ අත්දැකීම් විවරණය කිරීමෙනි. ඒ මත පරිසර හිතකාමී ලෙස කෙරෙන පළිබෝධ පාලන ක්‍රමවේදයන්ද ඔවුනට ආගන්තුක හා අමුතු ඒවා නොවීය.

මතු ප්‍රයෝජනය සඳහා හෝ මතක් කළ යුත්තේ කහ පුරුක් පණුවාට හේතුවෙන සලබයා පළමුව පැමිණෙන්නේ ළපටි ගොයමට බවයි. අද වනවිට එම අවධිය පසුවී ඇති නමුත් ලබන කන්නයේදී නම් ඒ අවස්ථාවේ සිටම සලකිලිමත්වීම වඩාත් සුදුසු පිළිවෙත වේ. සලබයා වැඩෙන ගොයමට පැමිණ බිත්තර දමන්නේ ගොයමට වයස සති දෙකක් වෙද්දී පටන්ය. උපදින පැටවුන් ඇතළත පටක කා දැමීම නිසා පෝෂණය නොමැතිව ගොබය මැරී යන අතර එය පහසුවෙන් ගැලවී යන්නේය. මෙම හානිය හැඳින්වන්නේ "මල හදවත" වශයෙනි. ගොයමේ හදවත රැකගන්නට නම් පෙරකී පරිදිම පඳුරු දැමීම අරඹන ගොයම ආශ්‍රිත සලබයින් සංගණනය කළයුතුය. මෙවර බණ්ඩි ගොයමට කරන්නා සේම පළිබෝධනාශක අවශ්‍ය අනවශ්‍ය භාවය ගණනය කරමින් තීරණ ගත යුතුය.

පළිබෝධනාශක යොදන්නේනම් භාවිතා කළයුත්තේ ගසට උරාගෙන ඇතුළත සිටිනා පණුවන් නසනා කැට කෘමිනාශකයකි. එය යොදන්නේ පසටය. පස තෙත්ව හෝ සෙන්ටිමීටරයක පමණ උසට ජල ස්ථරයක් සහිත විය යුතුවේ. දියර කෘමිනාශකයක් යොදන්නේනම් අවට සිටින සලබයින්ද විනාශවෙන පරිද්දෙන් සංස්ථානික (ගසට උරාගන්නා) සහ ස්පර්ශ කෘමිනාශක වර්ග යෙදිය යුතුවේ.

නැවතත් අප අවධාරණය කරන්නේ අනතුර දැක ප්‍රතිකාර කිරීමේ සිරිත අතහරින තුරු වැඩි වාසිය සතුරාට හිමිවෙන බවයි. සතුරාගේ පැමිණීම ඉව අල්ලමින් සිටිනා තරමට යුද්ධයක ජය තහවුරු වන්නේය. පළිබෝධකයින් සමග කරනා සටන වෙනුවෙන්ද එම යුධ උපක්‍රමයේ වෙනසක් වන්නේ නැත.

**පිටපත : සනත් එම්. බණ්ඩාර - සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ, ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය, ගන්නොරුව**

**තාක්ෂණික කරුණු : එස්.ආර්. සරත්චන්ද්‍ර, සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ/ කීට විද්‍යාඥ, වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය, බතලගොඩ**

පරිගණක නිර්මාණය : ගෝතමී ලියනගේ

අධීක්ෂණය හා උපදෙස් : ඩබ් .එල් හිරාන් පීරිස් (අධ්‍යක්ෂ - තොරතුරු හා සන්නිවේදන), අයි.එස්.එම් හලීම්දීන් (සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ)